SRI LANKA

histories that connect

සබැඳි ඉතිහාසය

இணைந்த வரலாறுகள்



# ස්ථානීය පාදක අධ්‍යයන සඳහා ගුරු මාර්ගෝපදේශකය

## පොළොන්නරුව ගවේශනය


COLLECTIVE FOR HISTORICAL DIALOGUE & MEMORY

EuroClio
Inspiring History and Citizenship Educators

SCOPE
Strengthening Social Cohesion and Peace in Sri Lanka

Co-funded by the European Union

german cooperation
DEUTSCHE ZUSAMMENARBEIT

Implemented by:
giz Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH

# ACKNOWLEDGEMENTS


**Author**

Buddisha Weerasuriya

**Editor**

Eugenie Khatschatrian



**Published by**

EuroClio - European Association of History Educators as part of the project *Histories that Connect Sri Lanka II*



**Copyright**

CC BY 4.0



**To cite this publication:**

Weerasuriya, B & Khatschatrian, E. (2025).
A Teachers' Guide for Place-based Learning: Exploring Polonnaruwa.
*EuroClio - European Association of History Educators.*

**Supported by**

*This publication was supported by the Strengthening Social Cohesion and Peace in Sri Lanka (SCOPE) programme. SCOPE is co-funded by the European Union and the German Federal Foreign Office and implemented by GIZ in partnership with the Government of Sri Lanka. The content of the publication does not represent the official position of the European Union, the German Federal Foreign Office, GIZ, or the Government of Sri Lanka.*

# ස්ථානීය පාදක අධ්‍යයන සඳහා ගුරු මාර්ගෝපදේශකය පොළොන්නරුව ගවේශනය

මෙම ගුරු මාර්ගෝපදේශය විසින් ශ්‍රීලංකාවේ ඉතිහාස ගුරවරුන්ට ස්ථානීය පාදක අධ්‍යනයක් සිදුකරන ආකාරය පියවරෙන් පියවර කියා දෙයි. සිසුන්ව ඔවුන්ගේ වටපිටාව හා ප්‍රජාව සමග සම්බන්ධ කිරීම තුළින් ඔවුන්ට එම ප්‍රදේශ පිළිබඳ අර්ථවත් අධ්‍යාපනික අත්දැකීමක් සේම පුළුල් ඓතිහාසික දැනුමක් ලැබේ. මෙම මාර්ගෝපදේශය පොළාන්නරුව පුරාණ නගරය ආදර්ශ කරගෙන සිදුකරන ලද ක්ශේත්‍ර චාරිකාවක පෙර, අතරතුර හා පසු තත්ත්වයන් අලලා කෙරන ඉදිරිපත් කිරීමකි.

**බුද්ධිෂ වීරසූරිය**
කර්තෘ

**ඉයුජින් කත්ස්වට්‍රියන්**
සංස්කාරක

## ස්ථානයේ බලය

ස්ථානීය පාදක අධ්‍යාපනය කලා හා මානව ශාස්ත්‍ර විෂයන්ට පමණක් සීමා වූවක් නොවේ. එය පාසැලේ වෙනත් ඕනෑම විෂයකට අදාළ කර ගත හැකි, ඕනෑම දේශීය සන්දර්භයක් තුළ භාවිත කළ හැකි, ඉගෙනුම් ප්‍රවේශයකි. මේ සඳහා සුදුසු ම විෂයක් ලෙස ඉතිහාසය සැලකිය හැක. පන්ති කාමරයෙන් පිටත ජාතික උරුමයන් සහිත ස්ථාන, ආගමික ස්ථාන, කෞතුකාගාර, ලේඛණාගාර, ආදි ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවලට සිසුන් යොමු කිරීම මගින් ඔවුන්ට ඔවුන්ගේ වටපිටාවේ ඉතිහාසය ගැන වඩාත් සජීවී දැනුමක්  හා ඔවුන්ගෙ ප්‍රජාව සමග වඩා සමීප සම්බන්ධයක් ගොඩනගා ගැනීමට අවස්ථාව හිමි කර දෙයි. ලෝකය තුළ තමන්ගේ භූමිකාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් එමගින් ඔවුන්ට හිමි කර දෙයි. දේශීය ඉතිහාසය ගවේශනය කිරීම,අතීතය ඔවුන්ගේ ප්‍රජාවට කෙසේ බලපෑවේද යන්න, හා එමගින් ඔවුන්ගේ අනන්‍යතාව කෙසේ වෙනස් වුනේ ද යන්නත්, එය තවදුරටත් වෙනස් වෙමින් පවතින්නේ කෙසේද යන්නත්, පිළිබඳ සිසුන්ගේ කුතුහලය ඇවිලවීම එහි අරමුණ වේ. මෙම ප්‍රවේශය තුළ සිසුන්ට ඔවුන්ගේ වටපිටාව ගැන පර්යේෂණය කිරීමට ඇති උනන්දුව වැඩි කරවයි. ඉතිහාසඥයාගේ සපත්තුවට බැස ඉතිහාසය අධ්‍යයනය කිරීමට ඔවුන්ව පොළඹවයි. මේ ඉතිහාස ගවේශනයේ දී බොහෝ විට අප්‍රසිද්ධ පුද්ගලික කතා ගැන ද ඔවුන්ට දැන ගන්නට ලැබෙයි. මේ අයුරින් දේශීය ඉතිහාසය සංරක්ෂණයට හා ප්‍රජාව තුළ ඓතිහාසික දැනුම්වත් බාවය වැඩි දියුණු කිරීමට තරුණයින් විසින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ස්ථානීය පාදක අධ්‍යයනය ඔබේ සිසුන්ට ඔවුන්ගේ රුචිකත්වය සොයා ගැනීමට කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීමට හා සහකම්පනය වැඩි දියුණු කිරීමට උපකාරී වේ. මෙයින් අදහස් කෙරෙන්නේ සිසුන්ට තමන් චාරිකා කරන ක්ෂේත්‍රය තුළ ඔවුන්ට ඉගෙනීමට අවශ්‍ය දේ අධ්‍යයනය කිරීමට අවශ්‍ය අවකාශය එමගින් නිර්මාණය කර දෙයි යන්නයි. වෙනත් විදියකින් කිවහොත් අදාළ ගමන තුළ සිසුන්ගේ ඉගෙනුම් අයිතිය උපරිම කිරීම මෙයින් අදහස් කෙරෙයි. ඔවුන්ගේ ගමනට උපකාරී වන මාර්ගෝපදේශ, මූලාශ්‍ර හා පැවරුම් සැපයීම ගුරුවරයා විසින් සිදුකරනු ලබයි. මාර්ගෝපදේශන රාමුවකට

බොහෝ ආකාර තිබිය හැක. චාරිකා කරන ක්ෂේත්‍රයේ ඓතිහාසික සන්දර්භය, මූලාශ්‍ර හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සකස් කරමින් ගුරුවරයාට සිසුන්ට උපකාර කළ හැක. මෙම ගුරු මාර්ගෝපදේශයේ අරමුණ වන්නේ ක්ෂේත්‍ර චාරිකාවක් කිනම් ආකාරයේ විය හැකි ද යන්න හා සිසුන්ට අර්ථවත් අධ්‍යාපන අත්දැකීමක් නිර්මාණය කිරීමට අවශ්‍ය පියවර කුමක් ද යන්න පිළිබඳ නිදර්ශන සැපයීමයි.

## ගුරුවරයාගේ භූමිකාව

ක්ෂේත්‍ර චාරිකාවක් යනු සිසුන්ට ඓතිහාසික ස්ථාන එකට ගවේෂණය කිරීමට, ඔවුන්ගේ රුචිකත්වය හඹායාමට, හා ඔවුන්ගේ අධ්‍යයන අරමුණු කුමක් ද යන්න ඔවුන්ටම තීරණය කිරීමට හිමිවන ඉතා වටිනා අවස්ථාවකි. ගුරුවරයෙකු වශයෙන් ඔබ අදාළ මාතෘකාව තෝරා ගත යුතු ය. ස්ථානය හඳුනා ගත යුතු ය. ක්ෂේත්‍ර චාරිකාව සංවිධානය කළ යුතු ය. ක්‍රියාකාරකම් සූදානම් කළ යුතු ය. ඓතිහාසික අන්තර්ගතයන් සැපයිය යුතු ය. එමෙන් ම අධ්‍යයන අත්දැකීම් සැලසුම් කිරීමේ දී මුල් අවධියේ සිටම සිසුන්ගේ නියෝජනය ද ඊට උපරිම වශයෙන් ලබා ගැනීමට ගුරුවරයාට කටයුතු කළ හැක. සිසුන් සමග අදාළ ක්ෂේත්‍රයේ ඔවුන් පර්යේෂණ කිරීමට කැමති මොනවා ගැන ද? සාමූහික ක්‍රියාකාරකම් සිදුකළ යුත්තේ කුමන ආකාරයට ද? ඔවුන් සොයා ගන්නා ඓතිහාසික තොරතුරු ඉදිරිපත් කරන්නට අදහස් කරන්නෙ කුමන ආකාරයෙන් ද? යනාදිය පිළිබඳව සාකච්ඡා කිරීමෙන් මෙය සිදු කළ හැක. ස්ථානීය පාදක අධ්‍යයන ව්‍යාපෘතියේ මෙම කොටසේදී ගුරුවරයා මාර්ගෝපදේශකයෙකු ලෙස තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරනු ලබයි. සිසුන්ට උපකාර අවශ්‍ය වේලාවේදී හා අවශ්‍ය ස්ථානයේ දී පුහුණුකරුවකු සේ උපකාර කරයි.

## පියවර මූලික ප්‍රවේශයක්

ඔබේ සිසුන් සඳහා ස්ථානීය පාදක අධ්‍යයන අත්දැකීමක් සංවිධානය කිරීම සමහර විට අභියෝගාත්මක විය හැක. ඒ සඳහා සූදානම් විය යුතු ය. මෙම ක්‍රියාවලියේදී ප්‍රායෝගික බාධා කිහිපයකට ඔබට මුහුණ දීමට සිදුවනු ඇත. ක්ෂේත්‍ර චාරිකා සංවිධානයේ දී ඔබට ඇති අතීත අත්දැකීම් අනුව එහි පහසුව තීරණය වනු ඇත. සමහර විට ඔබට ඉගැන්වීමට පැවරී ඇති විෂය මාලාව අනුව ද එය තීරණය වනු ඇත. ක්ෂේත්‍ර චාරිකාවට පෙර, ක්ෂේත්‍ර චාරිකාව අතරතුර, ක්ෂේත්‍ර චාරිකාවට පසුව ඔබට සිදු කළ හැකි ක්‍රියාකාරකම් පහත දැක්වේ. මෙහිදී භාවිත කෙරෙන ඓතිහාසික උදාහරණය වන්නේ පොළොන්නරුව පුරාණ නගරයයි. ඔබ එහි හෝ ඒ ආසන්නයේ සිටින්නේ නම් මෙම මාර්ගෝපදේශය සම්පතක් සේ සෘජුවම භාවිතයට ගත හැක. කෙසේ වුව ද මෙම ප්‍රවේශය විවිධ ඓතිහාසික උදාහරණ භාවිත කරමින් වෙනත් ඕනෑම ස්ථානයක දී හෝ ඕනෑම සන්දර්භයක දී භාවිත කළ හැක. ඔබේ වටපිටාවේ ඇති ඓතිහාසික ස්ථාන සොයා ගැනීමට බොහෝ දුර ගමන් කිරීමට හෝ විශාල පරිශ්‍රමයක් යෙදීමට අවශ්‍ය නැත. එය ඔබ ජීවත් වන ප්‍රදේශයේ ගොඩනැගිල්ලක්, ස්මාරකයක් හෝ වීදියක් විය හැක.

පහත දැක්වෙන ක්‍රියා පටිපාටියට අවශ්‍ය නම් ඔබ මීට කලින් සිදු කරන ලද ස්ථානීය පාදක අධ්‍යයන කටයුත්තක් ඔබට සුදුසු යැයි හැඟෙන්නේ නම් ආදේශ කළ හැක. සංක්ෂිප්ත වශයෙන් කිව හොත් මෙම ගුරු මාර්ගෝපදේශය ඔබේ ප්‍රදේශයේ ඔබේ සිසුන්ගේ අවශ්‍යතා හා එම සන්දර්භයට අනුව අනුවර්තනය කළ හැක.

මෙම ගුරු මාර්ගෝපදේශයේ අරමුණ වන්නේ ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම හා ඔබේ සිසුන් සඳහා ස්ථානීය පාදක අධ්‍යයන ක්‍රියාකාරකමක් සිදු කිරීමට සුදුසු ආකෘතියක් ඔබට සැපයීම ය. ඔබට මෙම ආකෘතිය පිළිබඳව දළ

විශ්ලේෂණයක් ලබා ගැනීම සඳහා අපි එය පහත දැක්වෙන පරිදි වඩාත් සංක්ෂිප්ත කරන්නෙමු. මෙම වැඩසටහනේ අධ්‍යයන ප්‍රතිපල ඇසුරෙන් ඔබට ඔබේ සිසුන් සමග සිදු කරන ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාවේ අධ්‍යයන අරමුණු වඩාත් සවිස්තරාත්මකව නිර්මාණය කළ හැක.

## ස්ථානීය පාදක අධ්‍යයන ආකෘතියේ වැඩසටහන් අධ්‍යයන ප්‍රතිඵල

| | |
|---|---|
| **කට පාඩම් කිරීම** | ▪ පොළොන්නරුවේ (හෝ ඔබ තෝරා ගන්නා වෙනත් ස්ථානයක) ප්‍රධාන ඓතිහාසික ස්ථාන හෝ බිම් සළකුණු හඳුනා ගන්න.<br>▪ අදාළ ස්ථානයේ ඓතිහාසික සිදුවීම්, හැඩතල, හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සිහිපත් කර ගන්න. |
| **අවබෝධය** | ▪ අදාළ ඓතිහාසික ස්ථානවල ඇති ඓතිහාසික වැදගත්කම පැහැදිලි කරන්න.<br>▪ අතීත සමාජ තත්ත්වය තේරුම් ගැනීම සඳහා පැරණි ශිලා ලේඛණ, ස්මාරක හා පුරා විද්‍යාත්මක සාක්ෂි අර්ථකථනය කරන්න. |
| **දැනුමේ ප්‍රායෝගික භාවිතය** | ▪ ඓතිහාසික ස්ථාන නිරූපණය කිරීම සඳහා මතක පාගමන් යන්න<br>▪ ඓතිහාසික ස්ථාන නිරූපණයට සිතියම් දෘෂ්‍ය ආධාරක හා කටු සටහන් භාවිත කරන්න.<br>▪ ඓතිහාසික ස්ථානවල වාස්තු විද්‍යාත්මක හා සංස්කෘතික වැදගත්කම තේරුම් ගැනීම සඳහා ඓතිහාසික ආකෘතීන් පිළිබඳ දැනුම භාවිත කරන්න. |
| **විවේචනාත්මක චින්තනය** | ▪ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල පෙර හා පසු විපරම ඓතිහාසික විතැන්වීම් සමග සසඳන්න.<br>▪ සෙල්ලිපි, ස්මාරක, හා කෞතුක භාණ්ඩ ඇසුරෙන් හෙලිදරව් වන අදාළ ස්ථානයේ ඇති සමාජ දේශපාලන හා සංස්කෘතික තත්ත්වය පරීක්ෂා කරන්න.<br>▪ ඉතා දැවැන්ත ඉදිකිරීම් පසුපස ඇති බල ධූරාවලිය, බහු සංස්කෘතික බලපෑම් සහ ශ්‍රම දායකත්වය පිළිබඳව වැටහීමක් ලබා ගන්න. |

| | |
|---|---|
| **ප්‍රක්ෂේපනය හා ඇගයීම** | ▪ ක්ෂේත්‍ර චාරිකාවේ ක්‍රියාකාරකම් හා මූලික ප්‍රවේශයන් ගැන පුද්ගලිකව හා සාමූහිකව පසු විපරමක යෙදෙන්න. මෙය චාරිකාවෙන් පසුව සිදු කළ හැකි අතර චාරිකාව අතරතුර දී ද සිදු කළ හැක. |

# පොළොන්නරුව ඓතිහාසික උරුමයන් සහිත ස්ථානවල සිදුකෙරෙන ක්ෂේත්‍ර චාරිකාව

ඔබ උගන්වන විෂය මාලාවට ගැලපෙන මාතෘකාවක් හා සුදුසු ස්ථානයක් තෝරාගැනීමේ ක්ෂේත්‍ර චාරිකා සංවිධානයේ පළමු පියවරයි. ඔබ තෝරා ගන්නා ස්ථානය ඔබ උගන්වන පන්තියට ඓතිහාසික වැදගත්කමක් ඇතැයි සිතෙන කෞතුකාගාරයක්, දේශීය ලේඛණාගාරයක්, පන්සලක්, පල්ලියක් විය හැක. එම ස්ථානය ඓතිහාසික වශයෙන් විවිධ හේතු නිසා වැදගත් ස්ථානයක් විය හැක. එය විවිධ අරමුණු නිසා වැදගත්වන ගොඩනැගිල්ලක් විය හැක. ඒ එක් එක් අරමුණු නිශ්චිත ඓතිහාසික කාල පරිච්ඡේදයක් නියෝජනය කරනවා විය හැක.

මේ ක්‍රමය තුළින් සිසුන්ට අදාළ ක්ෂේත්‍රයේ ඇති සංකීර්ණතා, ඒවායේ ඓතිහාසික අදාළත්වයන් හා ප්‍රජාව තුළ ඒවායේ අරමුණු විශ්ලේෂණය කිරීමට ඇති හැකියාව වැඩිවනු ඇත.ඕනෑම අදහසක් සම්බන්ධයෙන් සිසුන් දෙන උපදෙස් ඔබට සලකා බැලිය හැකියි. ඔබ තෝරා ගන්නා ක්ෂේත්‍රය අනුව (සමහර විට එය කෞතුකාගාරයක් විය හැක. නැතිනම් එය වෙනත් චාරිකාවක් විය හැක) ඊට අදාළව ඇති වන ප්‍රවාහන ගැටලු, දෙමාපියන්ගෙන් අවසර ගැනීම්, වෙනත් ඇති විය හැකි ප්‍රායෝගික දුෂ්කරතා ජය ගැනීමට සැලසුම් කිරීම සඳහා ප්‍රමණවත් කාලයක් ගන්න. ක්ෂේත්‍ර චාරිකාවක නිරත වීමෙදී ඔබේ සහ ඔබේ සිසුන්ගේ ආරක්ෂාව ගැන විශේෂයෙන් සැලකිලිමත් වන්න. ක්ෂේත්‍ර චාරිකාව අතරතුර විය හැකියාවක් සහිත අනතුරු ගැන ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගන්න. ඒවා වළක්වා ගැනීමට කටයුතු කරන්න.

ක්ෂේත්‍ර චාරිකාවට අවශ්‍ය සූදානම් වීමෙන් අනතුරුව සිසුන්ට ඔවුන්ගේ ක්ෂේත්‍ර අධ්‍යයන අත්දැකීමේ උපරිම ඵල නෙලා ගැනීම සඳහා කළ හැකි ක්‍රියාකාරකම් හා පැවරුම් ගණනාවක් තිබේ. මෙහිදී මූලාශ්‍ර විශ්ලේෂණය කිරීම, මතක පාඨමන්, විවිධ නිර්මාණාත්මක නිශ්පාදන සාමූහිකව නිර්මාණය කිරීම වැනි ක්‍රියාකාරකම් ඔබට යෝජනා කළ හැක. කෙසේ වුව ද ක්ෂේත්‍ර චාරිකාවට පෙර ක්ෂේත්‍ර චාරිකාව අතරතුර සහ ක්ෂේත්‍ර චාරිකාවෙන් ඔබට ඒ සඳහා වෙන් කළ හැකි කාලය හා ඔබේ හැකියා ප්‍රමාණය අනුව සිතමින් ඔබේ සිසුන්ගේ කැමැත්ත හා ඔවුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සිදු කළ යුත්තේ කුමන ක්‍රියාකාරකම් ද යන්න තීරණයට කිරීමට ඔබට නිදහස තිබේ.

ස්ථානීය පාදක අධ්‍යයන අත්දැකීමක් ලෙස පොළොන්නරුව පුරාණ නගරය ගැන ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සිදු කරන්නට ලැබීම ශ්‍රී ලංකාවේ පොහොසත් ඉතිහාසය හා සංස්කෘතික ජීවිතය ගැන අධ්‍යයනට කිරීමට උනන්දුවක් දක්වන සිසුවෙකුට හිමි වන ඉතා වැදගත් අවස්ථාවකි. පොළොන්නරුව පුරාණ නගරයේ ඇති පුරාවිද්‍යාත්මක නටඹුන්

ස්මාරක හා කෞතුක වස්තූන් ගවේශනය කිරීම තුළින් සිසුන්ට විවිධ ශිෂ්ටාචාර ආගම් හා සම්ප්‍රදායන් අතර ඇති අන්තර් ක්‍රියාකාරීත්වය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගත හැකි ය.

පොළොන්නරුවේ කලාව, ගෘහ නිර්මාණ ශිල්පය, හා ශිලා ලේඛණ අධ්‍යයනය කිරීම තුළින් සිසුන්ගේ විවේචනාත්මක චින්තන කුසලතාව දියුණු වේ. ඓතිහාසික සහකම්පනය වර්ධනය වේ. සංස්කෘතික විවිධත්වය ඇගයීම තුළින් අදාළ නගරය නිර්වචනය කිරීමට හැකි වේ. පොළොන්නරුවේ සිදු කෙරෙන ක්ෂේත්‍ර චාරිකාවක් මගින් මෙම පෞරාණික භූමියේ උරුමය අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට එහි භාරකරත්වය හා වගකීම දැරීමේ උවමනාවක් සිසුන් තුළ ඇති කෙරෙයි.

පොළොන්නරුව ශ්‍රී ලංකාවේ පොහොසත් සංස්කෘතික උරුමය හා එහි ඉතිහාසය වෙනස් වීම සඳහා සිදුවුණු බලපෑම් පිළිබඳ කදිම සාක්ෂියකි. පොළොන්නරුව පුරාණ නගරයේ පැවති කලාව, ගෘහ නිර්මාණ ශිල්පය, ආර්ථිකය, සමාජය හා බහු සංස්කෘතිකත්වය ඇසුරෙන් ස්ථානීය පාදක අධ්‍යයන අත්දැකීමක් ලෙස සිසුන්ට ඉතිහාසය හැදෑරීමට පොහොසත් අවස්ථාවක් හිමි වේ. අතීතය හා යා වීමට, අපගේ හවුල් උරුමයන් සංරක්ෂණය කිරීමට අගය කිරීමට එමගින් සිසුන්ව පොළඹවයි.

# ක්ෂේත්‍ර චාරිකාවට පෙර

ඔබේ සිසුන්ගේ අධ්‍යාපනික මට්ටම හා ඔබේ ඉතිහාස පන්තියේ ඉගැන්වීමට නියමිත මාතෘකාව අනුව සලකා බලා අවශ්‍ය ඓතිහාසික පසුබිම් තොරතුරු ලබා දී ඔවුන් ලවා යම් යම් ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කිරීම මගින් ක්ෂේත්‍ර චාරිකාවක් පිළිබඳ ඔවුන් තුළ උනන්දුවක් ඔබට ඇති කළ හැකි ය. මෙය ක්ෂේත්‍ර චාරිකාවකට පෙර සිදු කෙරන සූදානම් කිරීමේ එක් පාඩමක් ලෙස ගත හැකි ය. ක්ෂේත්‍රය පිළිබඳ ඓතිහාසික තොරතුරු හා ප්‍රාථමික මූලාශ්‍ර එක් රැස් කිරීමට ප්‍රමාණවත් කාලයක් වෙන් කර ගන්න.

## 1 වන පියවර - ඓතිහාසික පසුබිම් තොරතුරු සැපයීම

ඓතිහාසික අන්තර්ගත සංක්ෂිප්තය අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සිසුන්ගේ පෙළ පොතේ ප්‍රමාණවත් මට්ටමට තොරතුරු නොමැති නම් ඔබේ සිසුන්ට මාතෘකාව හඳුන්වා දීමට හා මූලික කරුණු අනාවරණය කිරීම සඳහා ප්‍රයෝජනවත් වන කෙටි ඓතිහාසික සංස්ක්ෂිප්ත ලේඛණයක් සකසන්න. මෙම සංක්ෂිප්ත ලේඛණයේ අදාළ තෝරා ගත් ක්ෂේත්‍රයේ නිශ්චිත කාල පරිච්ඡේදයක් පුරාවට එසේත් නැත්නම් ඉතිහාසය පුරාවට සිදුව ඇති සංස්කෘතික ආගමික හා ආර්ථික වැනි විෂයන්ගේ වැදගත් වෙනස්කම් ඇතුළත් කළ යුතු ය. පහත උදාහරණයේ දක්වා ඇති සැකිල්ල මේ සඳහා ඔබට ප්‍රයෝජනවත් වනු ඇත.

# පොළොන්නරුව

ශ්‍රී ලංකාවේ උතුරුමැද පළාතේ ඇති වැදගත් ඓතිහාසික ස්ථානයක් ලෙස පොළොන්නරුව පුරාණ නගරය සැලකේ. සශ්‍රීක වනාන්තරවලින් හා සතා සිව්පාවාගෙන් ගහන මිනිසුන් විසින් නිමවන ලද යෝධ ජලාශ දෙකකට මැදිව පිහිටා ඇති පොළොන්නරුව පුරාණ නගරය යුනෙස්කෝ ලෝක උරුමයකි. මේ ඉපැරණි නගරය දූපත් ජාතියක පොහොසත් සංස්කෘතිය නිරූපණය කරයි. පොළොන්නරුව පුරාණ නගරය කොළඹ අගනගරයේ සිට ආසන්න වශයෙන් කිලෝ මීටර් 140ක දුරින් පිහිටා ඇති අතර ගොඩබිමින් පහසුවෙන් ප්‍රවේශ විය හැක.

## ඉතිහාසය හා රාජ්‍ය වංශ

පොළොන්නරුව ශ්‍රී ලංකාවේ අගනුවර ලෙස ක්‍රිස්තු වර්ෂ 11 වන සියවසේ රටේ ප්‍රධානතම නගරය බවට පත් වූ අතර එතැන් සිට සියවස් ගණනාවක් යන තුරු රාජ්‍ය බලයේ කෙන්ද්‍රස්ථානය ලෙසින් පැවතියේ ය. මෙම කාල පරිච්ඡේදය තුළ චෝල රාජ්‍ය පාලනය යටතේ මෙම නගරය ඉහළම සෞභාග්‍යයක් හා සංස්කෘතික ජයග්‍රහණ බොහොමයක් අත්පත් කර ගෙන ඇති බව පෙනෙන්නට තිබේ. ප්‍රභල දකුණු ඉන්දීය රාජ්‍ය වංශයක් ලෙස සැලකෙන චෝල රාජ්‍ය වංශය එම ප්‍රදේශය යටත් කර ගත් අතර ඔවුන්ගේ පාලනය සැලකිය යුතු කාලයක් පොළොන්නරුවේ පැවතිණි.

ඉන්පසුව පොළොන්නරුව නගරය සිංහල රජවරුන්ගේ පාලනයට නතු වූ අතර සිත් ඇදගන්නා සුළු වාරි කර්මාන්ත පද්ධති, විහාරස්ථාන හා රාජ මාලිගා ආදි ඉදිකිරීම් නිසා පොළොන්නරුවේ භූමි දර්ශනය සදාකාලික සළකුණක් බවට පත්ව ඇත. පොළොන්නරුවේ සුප්‍රකටම පාලකයා ලෙස සැලකෙන්නේ පළවන පරාක්‍රමබාහු රජතුමා ය. ඔහු විසින් සිදුකරන ලද මහා ඉදිකිරීම් ව්‍යාපෘති හා යුධමය ක්‍රියාන්විතයන් දෙස බැලූ විට ඔහු උන්නතිකාමී රජෙක් බව පෙනෙයි. එතුමාගේ කාලය තුළ පොළොන්නරුව නගරය වාණිජ, සංස්කෘතික හා අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ලෙස එහි උච්චතම ස්ථානයට පත් විය.

## දකුණු ඉන්දියාව සමග සම්බන්ධතා

පොළොන්නරුව හා දකුණු ඉන්දියාව අතර ඇත්තේ ගැඹුරින් මුල් බැසගත් සම්බන්ධතාවකි. එමෙන්ම එම සම්බන්ධතාව බහුවිධ ආකාර වෙයි. පොළොන්නරුවේ ඉතිහාසය හා සංස්කෘතිය හැඩ ගැස්වීමෙයිලා දකුණු ඉන්දියාවේ චෝල රාජ්‍ය වංශය ඉතාම තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කළේ ය. පොළොන්නරුව නගරය චෝලයින් විසින් පාලනය කළා පමණක් නොව සංස්කෘතික හුවමාරුව, වෙළඳාම, හා කලාපය තුළ හින්දු ආගම පැතිරවීම සම්බන්ධයෙන් පහසුකම් සැලසීම ද සිදු කරන ලදි.

## කලාව හා වාස්තු විද්‍යාව

පොළොන්නරුවේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය එහි සංකීර්ණ කැටයම්, ආකර්ෂණීය කැටයම් , හා නව්‍ය ඉන්ජිනේරු විද්‍යාව ආදියෙන් වර්ණවත් වේ. මෙම නගරය තුළ ගල් විහාරය, එහි තිබෙන යෝධ බුද්ධ ප්‍රතිමා, ශිව දේවාලය අංක 1 හා අංක 2, රාජකීය මාලිගා සංකීර්ණය. තිවංක පිළිම ගෙය, නෙළුම් පොකුණ, ආලාහන

පිරිවෙණ, හා ලංකාතිලක විහාරය ඇතුළු හොඳින් සංරක්ෂණය කරන ලද පුරාවිද්‍යාත්මක ස්ථාන ගණනාවක්ම පිහිටා තිබේ.

පොළොන්නරුවේ වාස්තු විද්‍යාත්මක විලාසය දකුණු ඉන්දියානු සම්ප්‍රදායේ හා ස්වදේශීය සම්ප්‍රදායේ සම්මිශ්‍රණයක් පිළිබිඹු කරයි. ඉදිකිරීම් සඳහා ගල්, ගඩොල් හා ස්ටුකෝ භාවිතය මෙන් ම සංකීර්ණ කැටයම් හා මූර්ති ඇතුළත් වීම ද මෙම නගරයේ වාස්තු විද්‍යාත්මක උරුමයේ කැපී පෙනෙන ලක්ෂණයකි.

## ආර්ථිකය

පොළොන්නරුවේ බොහෝ දුරට පැවතියේ කෘෂි කාර්මික ආර්ථිකයකි. පුරාණ රජදරුවන් විසින් ගොඩ නැගූ විස්තීර්ණ වාරි මාර්ග පද්ධතිය මගින් ඊට විශාල දායකත්වයක් සලසන ලදි. අවට ජලාශවල ජලය ප්‍රයෝජනයට ගැනීමට ඇති හැකියාව හා වෙළඳ බෝගයක් ලෙස සහල් වලට ඇති ඉල්ලුම මත නගරයේ සමෘද්ධිමත් බව රැඳී තිබුනේ ය.

## සමාජය

පොළොන්නරුවේ සමාජ ධූරාවලියක් ආකාරයෙන් ආකෘතිගතව තිබිණි. එහි ඉහළම නිළයන් දැරුවේ රජු හා ප්‍රභූවරුන් ය. වෙළදාම්, ආගමික වත්පිළිවෙත් හා සංස්කෘතික හුවමාරු සිදුකරමින් සහජීවනයෙන් කල් ගෙවූ සිංහල හා දෙමළ ඇතුලු ජන වාර්ගික විවිධත්වයකින් සමන්විත ජනහනනයක් පොළොන්නරුව පුරාණ නගරයේ ජීවත් විය.

## බහුසංස්කෘතිකවාදය

පොළොන්නරුව නගරය යනු සංස්කෘතික ආගමික හා සම්ප්‍රදායන්ගේ සම්මිශ්‍රණයකි. එහි ඉතිහාසය හැඩ ගැස්වී ඇති ආකාරය දෙස බැලූ කල මේ බහු සංස්කෘතික බලපෑම මැනවින් පිළිබිඹු වෙයි. නගරය බෞද්ධ හා හින්දු ප්‍රජාවන්ට නිවහන විය. එය විචිත්‍රවත් සංස්කෘතික කළාලයක් බඳු විය. ඉපැරණි පොළොන්නරුවේ මෙම බහු සංස්කෘතික සිතුවම වර්ණවලින් පොහොසත් කරන්නට දකුණු ඉන්දියානු වෙළෙන්දන්ගේ, ශිල්පීන්ගේ හා විද්වතුන්ගේ ආගමනය හේතු සාධක විය.

ප්‍රාථමික මූලාශ්‍ර - ඓතිහාසික පසුබිම් තොරතුරු අනුගමනය කරමින් සූදානම් වීමේ පාඩමේ ඇති ප්‍රාථමික මූලාශ්‍ර භාවිත කරමින් අදාළ ක්ෂේත්‍රයේ ඉතිහාසය පිළිබඳව ඔබේ සිසුන්ට හඳුන්වා දීමට ඔබට අවස්ථාවක් ඇත. ප්‍රාථමික මූලාශ්‍ර යටතට පින්තූර, සිතියම් , පුවත්පත්වල පළ වූ ලිපි වැනි ලිපි ලේඛණ, වෙනස් කාල වකවානුවල අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වන මතක සටහන් ආදිය අයත් වේ. හැකියාවක් ඇත්නම් ඔබට මේ සඳහා ප්‍රදේශයේ ඇති ලේඛණාගාරවල හා කෞතුකාගාරවල සහාය ලබා ගත හැක. හැකියාවක් ඇත්නම් මාර්ගගත ක්‍රම හරහා අන්තර්ජාලයේ ඇති තොරතුරුද සොයා බැලිය හැක. මීළඟ පියවරේ දී අධ්‍යයන කටයුත්ත සඳහා ප්‍රාථමික මූලාශ්‍ර යොදා ගන්නා ආකාරය පොළොන්නරුව පුරාණ නගරයේ සිතියම් හා පින්තූර යොදාගනිමින් කළ අධ්‍යයනයක නිදර්ශනයක් ඇසුරෙන් තේරුම් ගනිමු.

# 2 වන පියවර - ඔබේ ශිෂ්‍යයන්ව සූදානම් කරන්න

## 1 හැඳින්වීම - මනස් සිතියම

ක්ෂේත්‍ර චාරිකාව ගැන හඳුන්වා දී ඔබේ සිසුන් විසින් කිරීමට නියමිත ක්‍රියාකාරකම් හා නැරඹීමට අපේක්ෂාවෙන් සිටින ස්ථාන පිළිබඳ කෙටි දළ විශ්ලේෂණයක් සිදු කර සූදානම් වීමේ පාඩම ආරම්භ කරන්න. ඔබ විසින් සකසන ලද ඓතිහාසික අන්තර්ගත සංක්ෂිප්ත ලේඛණය භාවිත කර ඔබට එය ඉදිරිපත් කිරීමක් ආකාරයෙන් ගෙන හැර දැක්විය හැක. ක්ෂේත්‍ර චාරිකා ව්‍යාපෘතියේ සෑම අදියරක් අවසානයේම සිසුන් විසින් උගත් දේ පෝස්ටරයක් චිත්‍රයක් හෝ නාට්‍යයක් ඇසුරෙන් නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව දැන් තියාම සිසුන්ව දැනුවත් කරන්න. ඔබේ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔබට සිසුන් සමග කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඉදිරි කටයුතු කරගෙන යා හැක.

A ඔබේ පන්තියේ සිසුන් පන්තියේ ප්‍රමාණය අනුව සලකා බලා හතර හෝ හය වශයෙන් කණ්ඩායම්වලට බෙදන්න. ඔවුන්ට හිස් කඩදාසි හා පෑන් ලබා දෙන්න.

B ඔබේ සිසුන්ව සක්‍රීය කරවීම සඳහා එක් එක් කණ්ඩායම් තුළ අදාළ ක්ෂේත්‍රය පිළිබඳවා දන්නා දේ හුවමාරු කරගැනීමට හා ඉදිරි වැඩ කටයුතු පිළිබඳ යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීම සඳහා සාකච්චාවක් අරඹන ලෙස ඉල්ලා සිටින්න. ඔවුන්ට දැනටමත් ඒ ගැන අවබෝධයක් ඇත්නම් ඔවුන්ගේ මනසේ ඇති සියලු දේ කොලයක සිතියම් ගත කරන්න ඔවුන්ව යොමු කරන්න සාමාන්‍යයෙන් මෙය හඳුන්වන්නේ brain storming යනුවෙනි.



ඡායාරූපය - 2024 මාර්තු මාසයේ පොළොන්නරුවේදී මාර්ගෝපදේශයකයා නියමු කාර්යභාරය අතරතුර ගුරුවරු විසින් අඳින ලද මනස් සිතුවමක්.

C සියලු කණ්ඩායම් සමග ඔවුන් සකස් කළ මනස් සිතියම් හුවමාරු කරගන්න යැයි යෝජනා කරන්න. මේ ආකාරයෙන් ඔබට ඔවුන්ගේ දැනුම එක්රැස් කර ගත හැකි අතර ස්ථානීය ක්‍රියාකාරකම් හා පරාවර්ථන අභ්‍යාස සකස් කිරීමේදී ඔබට ඔවුන්ගේ රුචි අරුචිකම් හා අවශ්‍යතා ගැන අවබෝධයක් ලබා ගත හැකි ය.

**2 මූලාශ්‍ර විශ්ලේෂණය -** ඔබ විසින් ඔබේ සිසුන්ට දැනටමත් අදාළ ක්ෂේත්‍රය හා එහි ඓතිහාසික පසුබිම පිළිබඳ හඳුන්වාදීමක් දැනටමත් සිදු කර ඇත. ක්ෂේත්‍රයේ ඓතිහාසික වැදගත්කම පිළිබඳ ඔවුන්ගේ අවබෝධය තවත් පුළුල් කිරීමට ඔවුන්ගේ සන්සන්දනාත්මක හා විශ්ලේෂණාත්මක හැකියාව අභියෝගයට ලක් කරන ක්‍රියාකාරකමක් සකසන්න. කේෂත්‍රයේ පින්තූර ද මේ සඳහා යොදා ගැනීමට ඔබට හැකි ය.

A නැවතත් පන්තියේ සිසුන් හතර දෙනා හෝ හය දෙනා බැගින් කණ්ඩායම්වලට බෙදන්න. පෙර ක්‍රියාකාරකම සිදුකළ කණ්ඩායමම වුව ද කමක් නැත. ඒ සෑම කණ්ඩායමකටම විවිධ ප්‍රාථමික මූලාශ්‍ර පහකින් හෝ හයකින් යුතු කට්ටලය බැගින් ලබා දෙන්න. සෑම කණ්ඩායමකටම ලබා දිය යුත්තේ එකම කට්ටලයකි.

# ප්‍රාථමික මූලාශ්‍ර පිළිබඳ උදාහරණ


Pali Text Society

THE MAHĀVAMṢA
OR
THE GREAT CHRONICLE
OF CEYLON

TRANSLATED INTO ENGLISH
BY
WILHELM GEIGER, PH.D.
PROFESSOR OF INDOGERMANIC PHILOLOGY
AT ERLANGEN UNIVERSITY

ASSISTED BY MABEL HAYNES BODE, PH.D.
LECTURER ON PALI AT
UNIVERSITY COLLEGE, LONDON

UNDER THE PATRONAGE OF THE GOVERNMENT OF CEYLON

London
PUBLISHED FOR THE PALI TEXT SOCIETY
BY
HENRY FROWDE
OXFORD UNIVERSITY PRESS, AMEN CORNER, E.C.
1912

**මහා වංශය -** මහා වංශය ශ්‍රී ලංකා පුරාවෘත්තයේ ආරම්භයේ සිට නූතනය දක්වා පොළොන්නරු යුගයේ සියලු සිදුවීම් පිළිබඳ තොරතුරු සපයයි.



**ගල්පොත සෙල්ලිපිය -** ගල් පොත යනු පොළොන්නරු රාජධානියේ දළදා මළුවේ දළදා මාලිගාව පැත්තට වන්නට පිහිටි නිශ්ශංක මල්ල රජුගේ (ක්‍රි.ව.1187 සිට 1196 දක්වා) ප්‍රධාන සෙල්ලිපිවලින් එකකි.



**වේලෙක්කාර සෙල්ලිපිය -** පල්ලව ග්‍රන්ථ අක්ෂරවලින් ලියා ඇති වේලෙක්කාර සෙල්ලිපිය තුළ රජු විසින් දන්ත ධාතුන් වහන්සේ ආරක්ෂා කිරීමට හින්දු වේලෙක්කාර හමුදාවට අවසර දුන් බව කියැවෙයි.



**ගල්විහාර සෙල් ලිපිය -** ශ්‍රී ලංකාවේ පොළොන්නරුව ගල් විහාරයේ ඇති සෙල් ලිපියකි. පළවන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153 සිට 1186 දක්වා) විසින් මෙය කරවා ඇති අතර බෞද්ධ ප්‍රජාව (සංඝයා වහන්සේලා) එක්සත් කිරීමට හා ප්‍රතිස්ථාපනය කිරීමට ගත් වෑයමක් පිළිබඳව එහි සඳහන් වෙයි. බුදු දහම සදාකාලිකව ආරක්ෂා කරනු සඳහා ඔවුන්ගේ ජීවිත මාවත ශෝධනය කරන ලෙස බෞද්ධ ප්‍රජාවගෙන් (සංඝයා වහන්සේලාගෙන්) ඔහු මේ මගින් ඉල්ලා සිටියි



මෙම කාසිය පොළොන්නරු රාජධානිය පාලනය කළ ලීලාවතී රැජිනගේ සමයට අයත් ය. එහි ඇති වටපාඨයේ සඳහන් වන්නේ ඇගේ නම පුරුෂ ස්වරූපයකිනි.
ශ්‍රී රාජා ලීලාවතී යනුවෙනි.

B මාර්ගෝපදේශක ප්‍රශ්න භාවිත කරමින් මූලාශ්‍ර ප්‍රවේශමෙන් අධ්‍යයනය කිරීමට කණ්ඩායම උනන්දු කරවන්න. ඔබ සොයා ගත් මූලාශ්‍රය අනුව ප්‍රශ්න සැකසීම සිදුකරන්න. මාර්ගෝපදේශක ප්‍රශ්න කට්ටලයක් සඳහා වන උදාහරණයක් පහත දැක්වේ.

- ඔබ දකින්නේ මොනවා ද?
- ඔබ සිතන ආකාරයට මෙම පින්තූරය රැගෙන ඇත්තේ කවදා ද?
- ඔබ සිතන ආකාරයට මෙම පින්තූරය රැගෙන ඇත්තේ කවුරුන් විසින් ද?
- මෙම පින්තූරය තුළින් අදාළ ස්ථානය පිළිබඳව පැවසෙන්නේ කිනම් කරුණු ද?
- මෙම පින්තූර තුළ ඔබට දකින්නට ඇති පුද්ගලයන් කව් ද? වස්තූන් මොනවා ද?

C කණ්ඩායම තුළ මූලාශ්‍ර විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ඔවුන්ගේ විශ්ලේෂණ ප්‍රතිඵල අනෙකුත් කණ්ඩායම් සමග හුවමාරු කරගැනීමට උනන්දු කරවන්න. මේ ආකාරයට ඔබේ සිසුන්ට ඔවුන් සොයා ගත් තොරතුරු එකිනෙකා සමග සන්සන්දනය කිරීමට ඒවායේ පැතිරුණු බව ගැන අවබෝධයක් ලබා ගැනීමට ඉඩ හරින්න.

ඉඟිය - විකල්පයක් වශයෙන් විවිධ කාල පරිච්ඡේදවල අදාළ ක්ෂේත්‍රවල පින්තූර හා සිතියම් සැපයීම මගින් සිසුන්ට ඔවුන් දකින දේ සන්සන්දනය කිරීමට ගලපා ගැනිමට ඔබට අවස්ථාව සලසා දිය හැක.

## 3 වන පියවර - අධ්‍යයනයේ අරමුණු

ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා සූදානම් වීමේ කටයුත්තේ අවසාන පියවර වන්නේ ඔබගේ සිසුන් සමග අධ්‍යයනයේ අරමුණු පිළිබඳව සාකච්ඡා කිරීමයි. ස්ථානීය පාදක අධ්‍යයන ව්‍යපෘතියක හදවත ලෙස සැලකෙන්නේ කණ්ඩායම් ක්‍රියාකාරකම් ය. ඔවුන් හතර දෙනා හෝ හය දෙනා බැගින් දිගටම කණ්ඩායම් වශයෙන් වැඩ කරන බව ඔබේ සිසුන්ට කියන්න.

තමන් මෙතෙක් ඉගෙන ගත් දේ හා අදාළ ක්ෂේත්‍රයේ දී ඉගෙන ගැනීමට අදහස් කරන දේ භාවිත කරමින් පිළිතුරු දීම සඳහා සුදුසු ප්‍රශ්නයක් ගොඩනගා ගැනීමට විනාඩි දෙකක පමණ කාලයක් සෑම කෙනෙකුටම සිතීමට ලබා දෙන්න. සමහර විට ඔවුන් විසින් කලින් කළ පැවරුම්වල, ඔවුන්ට තව දුරටත් අධ්‍යයනය කළ යුතු යැයි සිතෙන කරුණු තිබිය හැක. ඔවුන් වැඩි දියුණු කර ගැනීමට කැමති ඔවුන්ගේ හැකියාවන් (ඉදිරිපත් කිරීම වැනි) ගැන සිතා බැලීමට ඔවුන්ට එවැනිම කාලයක් ලබා දෙන්න. ඔවුන්ගේ අදහස් හැම විටම ලියා තැබීමටත් ඒවා අන් අය සමග හුවමාරු කරගැනීමටත් ඔවුන්ව උනන්දු කරවන්න. රුචිකත්වයන් මත පදනම්ව කණ්ඩායම් සෑදීමට මෙම ක්‍රියාවලිය උපකාරී වනු ඇත.

ප්‍රශ්න හා ප්‍රායෝගික කුසලතාවන් සමූහගත කිරීමට උත්සාහ කරන්න. දැන් සෑම කණ්ඩායමකටම එක් සමීක්ෂණ ප්‍රශ්නයක් හා ඊට පිළිතුරක් ලෙස ඉදිරිපත් කළ හැකි අවසාන නිශ්පාදනයක් ඇත.

ඉඟිය - සිසුන්ගේ අධ්‍යයන ක්‍රියාවලිය වඩා නිරවුල්ව නිරීක්ෂණය කිරීමට හා ඔවුන්ගෙ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උදව් කිරීම සඳහා ඔවුන්ට ලොග් පොතක් ලබා දෙන්න. සෑම කණ්ඩායමකටම ප්‍රශ්න ලිවීමට තොරතුරු එක් රැස් කිරීමට හා ඔවුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට එය උදව් කර ගත හැක.

### පූර්ව ක්ෂේත්‍ර චාරිකා පරාවර්ථන මොහොත

- ක්ෂේත්‍ර චාරිකාවකින් සිසුන් බලාපොරොත්තු වන්නේ මොනවා ද?
- ක්ෂේත්‍ර  චාරිකාව මොන වගේ ස්වභාවයක් ගනීවී ද?

## ක්ෂේත්‍ර චාරිකාව අතරතුර

දැන් එළැඹෙන්නේ ක්ෂේත්‍ර චාරිකාව සඳහා වන මොහොතයි. අදාළ ඓතිහාසික ප්‍රදේශයට සංචාර සංවිධානය කිරීම සඳහා ක්‍රම ගණනාවක් තිබේ. ඒ කුමන ආකාරය තෝරා ගත්තත් වඩාත් වැදගත් වන්නේ ඔබේ සිසුන්ට වටපිටාව සමග ක්‍රියාශීලිව සම්බන්ධ වීමට අවස්ථාව විවර වී තිබීමයි.

## මතක පාගමන්

ඔබට හැකියාවක් ඇත්නම් මතක පාගමනක් සංවිධානය කිරීමට දේශීය ඉතිහාසඥයෙකුගේ හෝ මාර්ගෝපදේශකයෙකුගේ සහාය ලබා ගන්න. මාර්ගෝපදේශකයා හා එක්ව ඔබේ කණ්ඩායම් විසින් සොයා ගත් සමීක්ෂණ ප්‍රශ්න පදනම් කරගෙන අදාළ ක්ෂේත්‍රයේ ඔබට නැරඹීමට අවශ්‍ය වැදගත් කොටස් හඳුනා ගන්න. ඔබට වඩාත් පහසු ඔබ විසින්ම අදාළ ක්ෂේත්‍ර චාරිකාව සංවිධානය කර ගැනීම නම් එහි ද ගැටලුවක් නැත. කුමන අකාරයෙන් වුව ද වඩාත් වැදගත් වන්නේ අදාළ ක්ෂේත්‍ර සීමාවේ වඩාත්ම වැදගත් ස්ථාන හඳුනාගැනීම හා එහි ඉතිහාසය හා වර්තමානය පිළිබඳ වැඩි වැඩියෙන් තොරතුරු එක්රැස් කර  ගැනීම ය. එම ක්‍රියාකාරකමෙහි අන්තර් ක්‍රියාකාරීත්වය තව තවත් තීව්‍රර කිරීමට ඔබට හෝ ඔබේ මාර්ගොපදේශකයාට සිසුන් දැනටමත් දන්නා දේ ගැන ඇසීමට හා ඒ ඒ ස්ථාන හෝ වස්තූන් ගැන ඔවුන්ට සිතෙන දේ දැනගැනීමට හැකි ය. ඔවුන්ගේ පර්යේෂණාත්මක ප්‍රශ්නයට අවශ්‍ය වන තොරතුරු එක් රැස් කිරීමට මතක පාගමන් යොදා ගන්නා ලෙස සිසුන්ට මතක් කර දෙන්න. මාර්ගෝපදේශකයාගෙන් ප්‍රශ්න ඇසීමෙන් ඔබේ සිසුන් ක්‍රියාශීලිව අදාළ ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ කිරීමට දිරිමත් කරවීම ඔබ විසින් සිදු කළ යුතුයි.

## ශිෂ්‍ය මාර්ගෝපදේශන

විකල්පයක් වශයෙන් මතක පාගමන් අතරතුර සෑම නැවතුමකදීම තමා උගත් දේ පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරන ලෙස ඔබට සිසුන්ගෙන් ඉල්ලා සිටිය හැකියි. එමගින් ඔවුන් තුළ සංචාරය සඳහා ඉහළ සූදානමක් ඇති කළ හැකියි. ක්ෂේත්‍රයේ විවිධ ස්ථාන හා විවිධ වස්තූන් සඳහා එක් එක් කණ්ඩායම වෙන වෙනම අනුගත කළ හැකියි. මේ ආකාරයට මතක පාගමනේ එක් එක් කොටස් සඳහා එක් එක් කණ්ඩායම් විසින් නියමු කාර්ය භාරයක් සිදු කරනු ලබයි.

# ශිෂ්‍යයින් වාර්තාකරුවන් ලෙස

ක්ෂේත්‍ර චාරිකාව අතරතුර කණ්ඩායම් සඳහා තනිවම ක්ෂේත්‍රය ගවේශනය කිරීමට යම් කාලයක් ලබා දෙන්න. මෙම ක්‍රමය තුළ අදාළ ස්ථානයේ විවිධ කොටස්වල තොරතුරු රැස් කර ගත හැකි අතර සමීක්ෂණ ප්‍රශ්නවලට වැඩි අවධානයක් ලබා දිය හැකි වේ. නිදසුනක් ලෙස එම ස්ථානවල සේවය කරන පුද්ගලයන් හා ඒ අසළින් යන එන පුද්ගලයන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට ඔවුන්ට අවශ්‍ය විය හැකි වේ. ඔවුන් එසේ සොයා ගත්තේ මොනවා දැයි අසන්න. මේ මගින් ඔවුන්ට ක්ෂේත්‍රය අවට ජීවත්වෙන ප්‍රජාව පිළිබඳව ද යම් අවබෝධයක් ලබා ගත හැකියි.

# පරාවර්තන ක්‍රියාකාරකම්

ක්ෂේත්‍ර චාරිකාවේ අවසාන ක්‍රියාකාරකම වන්නේ පූර්ණ පරාවර්තන සැසියකි. අදාළ ප්‍රදේශයේ එක් ස්ථානයකට සියලු කණ්ඩායම් එක් රැස් කරන්න. සංචාරයේදී ලද අත්දැකීම් එකිනෙකා සමග බෙදා ගන්න. ඔවුන් රැස් කළ සියලු තොරතුරු මෙහිදී ඉදිරිපත් කළ යුතුය යන්න මෙයින් අදහස් නොකෙරෙයි. සංචාරය පිළිබඳව ඔවුන්ට හැඟෙන ආකාරය පැවසීම මෙහිදී වැදගත් ය. සමහරවිට ඔවුන් හැඟීම්බරව සොයා ගිය යමක් තිබෙන්නට පුළුවන. ඔවුන්ට අවශ්‍ය යැයි හැඟෙන්නේ නම් ඒ බව පැවසීමට ඉඩදෙන්න.

# ක්ෂේත්‍ර චාරිකාවෙන් පසුව

ක්ෂේත්‍ර චාරිකාවෙන් පසුව ස්ථානීය පාදක අධ්‍යයන ව්‍යාපෘතිය සඳහා තවත් එක් පාඩමක් වෙන් කෙරෙයි. මෙම පාඩම අතරතුර එක් එක් කණ්ඩායම් විසින් ඔවුන් සොයා ගත් දේ ඉදිරිපත් කරනු ඇත. සෑම කණ්ඩායමක ඉදිරිපත් කිරීම් තවත් කණ්ඩායමකින් වෙනස්ව පෙනෙනු ඇත. කණ්ඩායම් ක්ෂේත්‍ර පරීක්ෂණයටත් ප්‍රථමයෙන් කණ්ඩායම් අවසන් ඉදිරිපත් කිරීමේ පෝරමය තීරණය කර තිබුණි. ඉදිරිපත් කිරීම පෝස්ටර්, චිත්‍ර, නාට්‍ය ආදි නිර්මාණාත්මක ආකාරයකින් සිදු කළ හැකියි. ප්‍රමාණවත් කාලයක් තිබේ නම් කණ්ඩායම්වලට පාඩම අතරතුරදීම මේ සඳහා සූදානම් විය හැක. එය එසේ කළ නොහැකි වුවහොත් ක්ෂේත්‍ර චාරිකාවෙන් පසුව එය ගෙදර වැඩ වශයෙන් ද සිදු කළ හැක. පර්යේෂණ මූලාශ්‍ර හා ක්ෂේත්‍ර චාරිකාව හරහා ඔවුන් විසින් එක්රැස් කර ගත් තොරතුරුවලට අනුව ක්ෂේත්‍ර චාරිකාවට කලින් කණ්ඩායම් වශයෙන් හඳුනා ගත් පර්යේෂණ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අවසාන ඉදිරිපත් කිරීම තුළින් සිදුවිය යුතු ය.

# අවසන් පරාවර්තන ක්‍රියාකාරකම

ඉදිරිපත් කිරීම අවසන් කළ පසු එළැඹෙන්නේ අවසන් පරාවතර්තන ක්‍රියාකාරකම සිදුකරන මොහොතයි. පහත දැක්වෙන මාර්ගෝපදේශක ප්‍රශ්න ගැන ඔබේ සිසුන්ට තනි තනිව අදහස් කිහිපයක් ලිවීමට විනාඩි 10ක පමණ කාලයක් ලබා දෙන්න.

- මෙම චාරිකාවෙන මම ඉගෙන ගත්තේ මොනවා ද?
- මා වඩාත්ම රසවින්දේ කුමන කොටස ද?
- මා අඩුවෙන්ම රසවින්දේ කුමන කොටස ද?

- ප්‍රායෝගිකව ගත් කල මට වඩාත්ම අභියෝගාත්මක වූයේ කුමන කොටස ද?
- මම මගේ අධ්‍යයන අරමුණ ඉටු කර ගත්තා ද?
- මීට වඩා වෙනස් යමක් මට කරන්නට තිබුණා ද?
- මෙම ව්‍යපෘතියේ නැවතත් යෙදීමට මම කැමති ද?

ඔබට කාලය තිබේ නම් සෑම සිසුවෙකුටම ඔවුන්ගේ පරාවර්ථන වෙන වෙනම කෙටියෙන් ඉදිරිපත් කිරීමට ඔබට අවස්ථාව සැලසිය හැක. ඒ සඳහා ඔබට ප්‍රමාණවත් කාලයක් නොමැති නම් හෝ එසේ කිරීම නිසා සිසුන් අපහසුතාවට පත්වනු ඇතැයි ඔබට හැඟේ නම් ඔවුන්ට ඔවුන් ළඟ සිටින පුද්ලයා සමග යුගල වශයෙන් අදහස් බෙදාගන්නා ලෙස ඔබට යෝජනා කළ හැක.

## ඓතිහාසික ක්ෂේත්‍ර පිළිබඳව වන වෙනත් උදාහරණ

මෙම මාර්ගෝපදේශයෙහි දක්වා ඇත්තේ ස්ථානීය පාදක අධ්‍යයන ව්‍යාපෘතියක් කෙබඳු විය හැකි ද යන්න වටහා ගැනීම සඳහා යොදාගත් එක් ඓතිහාසික ක්ෂේත්‍රයකට හා පැවරුමකට අදාළ වන උදාහරණයක් පමණි. ඔබේ සිසුන්ගේ තත්ත්වය හා අවශ්‍යතා වටහා ගනිමින් ඔබ උගන්වනු ලබන කලාපය ද සැලකිල්ලට ගනිමින් මෙම පැවරුම ඔබට සුදුසු යැයි හැඟෙන පරිදි ඔබේ ප්‍රාදේශීය සන්දර්භයට සාපේක්ෂව අනුවර්ථනය කර ගත හැක.

ස්ථානීය පාදක ඉතිහාස අධ්‍යයන ව්‍යාපෘතියකට සුදුසු වන ශ්‍රී ලංකාවේ තවත් ඓතිහාසික ක්ෂේත්‍ර කිහිපයක්.

- ගාලු කොටුව
- මහනුවර දළදා මාලිගාව
- යාපනය කොටුව
- කතරගම මහා දේවාලය
- සීගිරිය
- ත්‍රිකුණාමල වරාය
- අනුරාධපුර පෞරාණික නගරය
- යාපහුව පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍රය
- පඬුවස්නුවර පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍රය
- උච්චමුනි මුහුදු ගම්මානය
- බේරුවල පුරාණ වරාය හා කෙච්චිමලේ මුස්ලිම් පල්ලිය

## 2024 පොළොන්නරුවේ පැවති ගුරු වැඩමුළුවෙන් උපුටාගන්නා ලදි

මෙම මාර්ගෝපදේශය අවසන් කිරීමේ දී පොළොන්නරුව කලාප අධ්‍යාපන කොට්ඨාසයේ ඉතිහාස ගුරුවරුන් සමග මාර්ගෝපදේශක රාමුව හා මාර්ගෝපදේශයේ යෝජනා කර ඇති සමහර ක්‍රියාකාරකම් නියමු කිරීම සඳහා ගුරු වැඩමුළුවක් සංවිධානය කිරීමට මෙහි කතුවර බුද්ධිෂ වීරසූරිය මහතාට අවස්ථාවක් ලැබුණි. මෙම මාර්ගෝපදේශය

තවදුරටත් අනුවර්ථනය කරමින් වැඩි දියුණු කිරීමට මෙම නියමු සැසියේ ප්‍රවේශයන් භාවිත කරන ලදි. මෙම ගුරු වැඩමුළුව සංවිධානය කරන ලද්දේ ඉතිහාසයට මුලපිරීමක් යන ආකෘතිය තුළ ය. පොළොන්නරුව කලාපය ගත් කල එය වරප්‍රසාද සහිත පාසල් මෙන් ම වරප්‍රසාද අහිමි දුෂ්කර පාසල්වලින් ද සමන්විත කලාපයකි. එනම් විවිධ අධ්‍යයන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය කරන සම්පත් සෑම පාසැලකටම සමානව නොමැත. ඒ කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ක්‍රිස්තු වර්ෂ 12 වන සියවසේ දි දෙවන අගනුවර ලෙස නම් කෙරුණු පොළොන්නරුව යුනෙස්කෝව විසින් ලෝක උරුමයක් ලෙස නම් කිරීමට හේතු වූ සුවිශේෂී ලක්ෂණවලින් සමන්විත වූ නගරයකි. මිනිත්තු කිහිපයක් ඇතුළත ඓතිහාසික වැදගත්කමින් අනූන ස්ථාන ගණනාවකට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ක්ෂේත්‍ර චාරිකාවකට හා ස්ථානීය පාදක අධ්‍යයන ව්‍යාපෘතියක් සඳහා පොළොන්නරුව කදිම නිදසුනක් ලෙස සැලකිය හැක.

මෙයට සහභාගි වූවන් ප්‍රථමයෙන්ම පූර්ව වැඩ සැසියක් සඳහා සහභාගි විය. එහිදී ඔවුන් විසින් පොළොන්නරුව නගරය විස්තර කිරීම සඳහා කණ්ඩායම් වශයෙන් මනස් සිතියම් නිර්මාණය කිරීම සිදු කරන ලදි. මෙම ක්‍රියාකාකම විසින් ඔවුන්ව ස්වයං පරාවර්ථනයක් සඳහා දිරිමත් කරන ලදි. පාරඉගෙනුම් සංරචක ඊට ඇතුළත් විය. කණ්ඩායම් විසින් මිනිත්තු 30 කට පසුව ඔවුන්ගේ මනස් සිතියම් ඉදිරිපත් කොට ඔවුන්ගේ අදහස් සාකච්ඡාවට බඳුන් කරන ලදි. අනතුරුව ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් අදියර ආරම්භ විය. සහභාගි වන්නන් විසින් මතක පාගමන් ක්‍රියාකාරකම හරහා පුරාණ පොළොන්නරුව නගරය ගවේශනය කරන ලදි. ඉන්පසුව විවිධ වූ වාස්තු විද්‍යාත්මක හා ඓතිහාසික ලකුණු නිරීක්ෂණය කිරීම සඳහා දළදා මළුවේ හා ශිව දේවාල පරිශ්‍රයේ අන්වීක්ෂීය පරීක්ෂාවන් සිදුකරන ලදි.

සහභාගි වූවන් නැවත පැමිණීමෙන් පසු ඔවුන් අලුතෙන් සොයා ගත් තොරතුරු ඇතුළත් කරමින් ඔවුන් විසින් කලින් සකස් කළ මනස් සිතියම් සංශෝධනය කරවන ලදි. මුල් අදියරේදී ඔවුන්ගේ මනස් සිතියම්වල මූලික වශයෙන් අවධානය යොමු වී තිබුනේ රජවරුන්, ඇමතිවරුන්, ස්මාරක ඉදිකිරීම් හා දැවැන්ත වාරි පද්ධති ආදිය පිළිබඳ ව ය. නමුත් ක්ෂේත්‍ර චාරිකා ක්‍රියාකාරකම්වල නිරතවීමෙන් පසුව ඔවුන් බහු සංස්කෘතිකත්වය බල ධූරාවලිය, උරුමය, නියෝජනය, හා මෙම මහා ඉදිකිරීම් පසුපස ඇති ශ්‍රම බලකාය. වැනි පුළුල් තේමාවන් ඔස්සේ කරුණු එක් රැස් කළ හ.

සමාප්ති සාකච්ඡාවකදී ගුරුවරුන් තම ඇත්දැකීම් බෙදා ගත් අතර පොළොන්නරුවේ විකාශය පිළිබඳ ඔවුන්ගේ දෘෂ්ටි කෝණයෙන් අදහස් ඉදිරිපත් කළ හ. ඉතිහාසය ඉගැන්වීමේ දී ක්ෂේත්‍ර පාදක ක්‍රියාකාරකම්, මතක පාගමන්, කණ්ඩායම් ක්‍රියාකාරකම්, නිර්මාණාත්මක ව්‍යාපෘති. සහ දෘෂ්‍ය ආධාර වල ඇති වැදගත්කම මෙහි දි ඔවු හු අවධාරණය කළ හ. මේ අතර ශ්‍රී ලංකාවේ ඉතිහාස විෂය මාලාව හා නව ඉගැන්වීමේ ක්‍රම වේද ක්‍රියාත්මක කිරීමේදී මුහුණදීමට සිදුවන ප්‍රායෝගික දුෂ්කරතා මා අභියෝග පිළිබඳව ඔවුන් කතා කළ හ. ඊට අමතරව ඉතිහාසය විෂය තුළ ස්ථානීය පාදක අධ්‍යයනයේ ඇති ශක්තීන් හා දුර්වලතා ඔවුන් සාකච්ඡා කළ හ.



ඡායාරූපය - 2024 මාර්තු පොළොන්නරුවේ ක්ෂේත්‍ර චාරිකා
ක්‍රියාකාරකම් අතරතුර මතක පාගමනට සහභාගි වූ ගුරුවරුන්



ඡායාරූපය - 2024 මාර්තු පොළොන්නරුව ක්ෂේත්‍ර චාරිකා ක්‍රියාකාරකමෙන්
පසුව සිදු කළ පරාවර්ත ක්‍රියාකාරකමේ යෙදෙන ගුරුවරුන්



ඡායාරූපය - 2024 මාර්තු මාර්ගෝපදේශයේ නියමු වැඩමුළුව
අතරතුර පොළොන්නරුව අධ්‍යාපන කළාපයේ ඉතිහාස ගුරුවරුන්